### පලස්තීන රාජ්‍යයක් පිලිබඳව බුෂ්ගේ දර්ශනය:

# ඊශ්‍රායලයට යටහත් වූ හා ප්‍රධාන බලවතුන්ගේ රැකවල් යටතේ ඇති රාජ්‍යයක්

## Bush's vision of a Palestinian state: Subservient to Israel and policed by the major powers

**ජීන් ෂෝල් විසිනි**
**2008 ජනවාරි 12**

ඊශ්‍රායලයෙහි හා පලස්තීන ප්‍රදේශවල නැවතුම් සහිතව ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ මැද පෙරදිග සංචාරයෙහි පලමුවැනි කොටස ඊනියා " සාම ක්‍රියාවලිය" ඉදිරියට ගෙන යෑමට සහාය වීමත් 2009 වසර වන විට පලස්තීන රාජ්‍ය ස්ථාපිත කිරීමත් ඉලක්ක කොට ගත් එකකැයි ජාත්‍යන්තර පුවත්පත් මුලුමනින්ම පාහේ විවේචනයකින් තොරව යලි ප්‍රකාශ කොට ඇත.

සිය තනතුරින් ඉවත්වීමට ප්‍රථම පූර්න සාම සම්මුතියකට එලඹෙනු ඇතැයි අනාවැකි පල නොකල ද "මගේ නිගමනය අනුව එවැනි රාජ්‍යයක ස්වභාවය කවරේද යන්න ගැන එකඟත්වයකට පැමිනිය හැකිවනු ඇතැ"යි ඊශ්‍රායල රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකදී බුෂ්ම පැවසුවේ. "මගේ කාල සටහනට අනුකූලව ප්‍රශ්නය පිලිබඳව විසඳුමකට ඒමට බලකිරීමට අදහස් නොකරමි. එනමුදු, අගමැති (එහුඩ්) ඔල්මර්ට්ට හා ජනාධිපති (මහමුඩ්) අබ්බාස්ට සම්මුතියකට පැමිනීමට අවශ්‍යතාවක් ඇතැයි විශ්වාස කරමි" යයි ඔහු තවදුරටත් කියා සිටියේය.

බුෂ් මේ කියාපාන පලස්තීන රාජ්‍යයක් කෙදිනක හෝ ස්ථාපිත වන්නේ නම්, එය එක්සත් ජනපදය, ඊශ්‍රායලය, යුරෝපා බලවතුන් හා අරාබි ධනේශ්වර තන්ත්‍රයන්, විශේෂයෙන්ම ඊජිප්තුව, සම්බන්ධවන හමුදාමය හා දේශපාලන ආක්‍රමනයක් තුලින් පලස්තීනුවන් මත බලෙන් පටවනු ලබන්නක් විය හැක. මෙහිදී අබ්බාස්ගේ හා පලස්තීන අධිකාරියේ (පීඒ) භූමිකාව වන්නේ වාඩි ලා ගත් ප්‍රදේශ බටහිර රැකවරනය යටතේ පවතින රටක් බවට පරිවර්තනය කිරීමෙහි ලා ඔවුන්ගේ ප්‍රාදේශීය ඒජන්තවරයා වශයෙන් ක්‍රියාකිරීම ය.

නොවැම්බරයෙහි පවත්වන ලද ඇනාපොලිස් සම්මේලනය ඥටාහි නායකත්වය දරන පලස්තීන අධිකාරියේ ජනාධිපති අබ්බාස් සමග සාම ක්‍රියාවලියේ ආරම්භය විය හැකි යයි සැලකේ.

එනමුදු, කවර හෝ සාකච්ඡාවක් සඳහා ඔල්මර්ට්ගේ පලමුවැනි කොන්දේසිය වන්නේ ගාසා තීරුවේ සිට ඊශ්‍රායලය වෙත රොකට් හා මෝටාර් වෙඩි පත්තු කරන හමාස් හා ඉස්ලාමීය ජිහාඩ් ඇතුලු සන්නද්ධ කන්ඩායම් පාලනය කිරීම යි. පලස්තීනුවන් එසේ කරන තුරු තමා කිසිදු ගිවිසුමක් ක්‍රියාත්මක නොකරන බවට ඔහු යලියලිත් අනතුරු හඟවා ඇත. ඊශ්‍රායලයට විරෝධය දැක්වීමට එරෙහිව අබ්බාස් පූර්න සිවිල් යුද්ධයක් ගෙන යා යුතු බවට මෙය පැහැදිලි පනිවුඩයකි. අබ්බාස්ට එසේ කිරීමට හැකියාවක් නැත්නම් හෝ ඔහු එසේ නොකරන්නේ නම්, ඊශ්‍රායලය එය කරනු ඇත.

සාකච්ඡා පැවැත්වෙන කාල වකවානුව පුරා බටහිර ඉවුරෙහි හා ගාසා තීරුවෙහි සිය ප්‍රතිපත්තිවලට විරුද්ධවන ඕනෑම ප්‍රතිවිරෝධයකට එරෙහිව මෙහෙයුම් දියත් කිරීමට ඊශ්‍රායලයට නිදහස තිබිය යුතුය යන්නට ඔල්මර්ට්, බුෂ්ගේ එකඟතාවය පතා ඇත. පලස්තීන ආන්ඩුව හා හමාස් සාමාජිකයන්ගෙන් සමන්විත ජාතික එකමුතු ආන්ඩුවක් කෙසේ වෙතත්, පීඒ හා හමාස් අතර කුමන ආකාරයේ හෝ ප්‍රතිසන්ධානයක් කිසි සේත්ම පිලිගත නොහැක.

මෙයට අනුග්‍රහ දැක්වීමට අබ්බාස් සියලු උත්සහයන් දරා ඇත. ඊශ්‍රායල ආරක්ෂක බලකායක් වන ෂින් බෙට් විසින් නිකුත් කරන ලද වාර්තාවකට අනුව, නොවැම්බර් 29 වැනිදාට පසුව පලස්තීන ආරක්ෂක බලකායන් බටහිර ඉවුරෙහි හමාස් ක්‍රියාකාරීන් 250කට අධික පිරිසක් අත් අඩංගුවට ගෙන තිබේ. වැඩි වශයෙන් නැබ්ලුස්හී හා හෙබ්රොන්හි දී මෙම අත් අඩංගුවට ගැනීම් සිදු කර තිබෙන අතර ඔවුන්ගේ ආයුධ රාජසන්තක කොට ඇත. රැඳවියන්ගෙන් සමහරෙක් පුන්‍යායතන ද ඇතුලු හමාස් සංවිධානය තුල හමුදාමය නොවන සංවිධානවලට අයත් පුද්ගලයෝ ය. පීඒ ආරක්ෂක සේවාවන් විසින් ඇතැම් ඥටා සටන්කාමීන් ද අත් අඩංගුවට ගෙන තිබේ.

සිය සංවිධානය, ආයතන හා සාමාජිකයන් දේශපාලන හිංසනයට ලක් කිරීම ගැන හමාස් සංවිධානය පීජ් වෙත චෝදනා එල්ල කර ඇත. මෙසේ දැඩි ලෙස ක්‍රියාකිරීම, හමාස් හා ෆාටා අතර බලය බෙදා ගැනීමේ එකඟතාවක් පිලිබඳ සාකච්ඡාවලට අරාබි තන්ත්‍රයන් විසින් ගන්නා ලද උත්සාහයන්ට එල්ල කරන ලද මරු පහරක් ලෙස ප්‍රකාශකයෙක් විස්තර කලේ ය. බුෂ් සතුටු කිරීම සඳහා ගුරුවරුන් හා විද්වතුන් ද ඇතුලුව දේශපාලන අත් අඩංගුවට ගැනීමේ ව්‍යාපාරයක් දියත් කිරීම සම්බන්ධයෙන් ඔහු පලස්තීන අධිකාරියට චොදනා කලේ ය.

ඇනාපොලිස් සම්මේලනයෙන් අනතුරුව, ඊස්රායලය සිය ආරක්ෂක මෙහෙයුම් තීව්‍ර කර තිබේ. විරුද්ධවාදීන්ට එරෙහිව බොහෝ විට පලස්තීන ආරක්ෂක බලකායන් සමග එකට පෙල ගැසී නබ්ලුස් හි හා බටහිර ඉවුරෙහි හමාස් සහායකින් වටලමින් එසේ කර ඇත. ඊස්රායල ආරක්ෂක බලකා(අයිඩීඑෆ්) සමග එතරම් විවෘතව සහයෝගීව කටයුතු කිරීම හේතු කොට ගෙන පලස්තීනුවන් අතර පීජ්ය තව දුරටත් අපකීර්තියට පත්ව ඇත.

පලස්තීන රැඳවියන් හමුදාමය නඩු විභාගවලට ලක් කොට ඇත. ඊස්රායල මානව අයිතීන් සුරකින කන්ඩායමක් වන යෙෂ්ඩින් සංවිධානය විසින් මෑතක දී පල කරන ලද වාර්තාවකට අනුව, චූදිතයන් අතුරින් සියයට 99.7ක වැරදිකරුවන් ලෙස ප්‍රකාශයට පත් කොට ඇත. ඉන් සියයට 95ක් ආයාචනා ගනුදෙනුවල සම්මුති වශයෙනි. නඩු ඇසීම් මෙහෙයවන්නේ ප්‍රමානවත් අරාබි භාෂි පරිවර්තනයකින් තොරව, හීබෲ භාෂාවෙනි. දැනට ඊස්රායල හිරගෙවල රඳවාගෙන සිටින සිරකරුවන් 9000න් අඩකට ආසන්න පිරිසකට දඬුවම් නියම කොට ඇත්තේ එවැනි හමුදා උසාවි මගිනි. පලස්තීන රැඳවියන්ට අයුතු ලෙස සැලකීම පිලිබඳ චෝදනා, හමුදාව විමර්ශනය කර නැතැයි ද යෙෂ්ඩින් සංවිධානය ප්‍රකාශ කරයි. ඊස්රායලය 2005 අගෝස්තුවේ ගාසා තීරුවෙන් ඉවත් වූ බව කියනු ලබතත් ගාසා තීරුවේ හමාස් සංවිධානය විසින් පාලනය කරනු ලබන ප්‍රදේශවල නිතිපතාම වාගේ ඊස්රායල හමුදා ආක්‍රමන සිදු කෙරෙයි.

බුෂ්ගේ සංචාරයට පෙරාතුව, පලස්තීනුවන් මත ප්‍රහාර වැඩි කිරීම පිලිබඳව පලස්තීන සාකච්ඡා මෙහෙයවන්නෙක් වන සයිබ් එරෙකාට්, ඊස්රායලය චෝදනා කර තිබේ. දකුනු දිග ඊස්රායල නගරවලට ගාසා තීරුවෙන් එල්ල කරන ලද රොකට් ප්‍රහාරවලට එරෙහිව ඊස්රායල ප්‍රහාර තීව්‍ර කරන ලෙස ආරක්ෂක බලකායන්ට සැබැවින් ම නියෝග කොට ඇති බව ඔල්මර්ට් තහවුරු කලේ ය. ඊස්රායල ආරක්ෂක හමුදා (අයිඩීඑෆ්) බ්‍රහස්පතින්දා, පලස්තීනුවන් දෙදෙනෙකු මරා දැමූහ. ඉරිදා සිවිල් වැසියන් දෙදෙනෙකු ද ඇතුලුව, පස් දෙනෙකු මරා දැමූහ. බුෂ්ගේ සංචාරයේ ප්‍රථම දිනය ව බදාදා තුන් දෙනෙකු මරා දැමූහ.

ඊස්රායලයට එල්ල කර ඇති රොකට් ප්‍රහාර සම්බන්ධයෙන් තමා අබ්බාස්ගෙන් ප්‍රශ්න කරන බව බුෂ් ප්‍රකාශ කලේ ය. "රොකට් ප්‍රහාර සම්බන්ධයෙන් මවිසින් ජනාධිපති අබ්බාස් වෙත එල්ල කෙරෙන පලමුවන ප්‍රශ්නය මෙයයිඃ 'ඒ ගැන ඔබ කරන්න යන්නේ කුමක් ද?' තම දේශ සීමාවේ කොටසක සිට තම ජනයා ලවා ඊස්රායලය වෙත රොකට් එල්ල කිරීම තමන්ගේ අවශ්‍යතාවන්ට නොගැලපෙන බව ඔහු දනී. ත්‍රස්තවාදී ප්‍රහාර දියත් කිරීමේ වේදිකාවක් බවට සිය මායිමෙහි ඇති රාජ්‍යයක් පත්වීම පිලිගැනීම ඊස්රායලවරුන්ගෙන් අපේක්ෂා කල නොහැක්කකි. සත්තකින් ම, මම ද එවැන්නක් පිලිනොගනිමි." ඔහු පැවසුවේ ය.

ගාසා තීරුව සමග ඇති මායිම ඊස්රායලය අවුරා ඇත. ගාසා හි වැසියන් හමාස් සංවිධානයට එරෙහිව උසිගැන්වීමේ අරමුන ඇතිව, බෙහෙත් වර්ග ද ඇතුලුව ගාසාවල කෙරෙන සියලු ම සැපයුම් පාහේ, ඊස්රායලය කපා හැර ඇත. වෛද්‍ය ප්‍රතිකාර නොමැති වීම ද යෝග්‍ය සත්කාර ලබා ගැනීම සඳහාජනයාට ඊජිප්තුව හෝ ඊස්රායලයට යෑම ඊස්රායලය විසින් ප්‍රතික්ෂේප කිරීම ද හේතු කොට ගෙන සිය ගනන් ජනතාව බරලතල ලෙස රෝගීව මරනයට මුහුන දී සිටී.

ඊස්රායල ආන්ඩුව සිය ඉන්ධන හා බලශක්ති සැපයුම් බරපතල ලෙස අඩු කර තිබේ. මේ නිසා දැනටමත් අතිශය බැරෑරුම් තත්වයක ඇති මානව සුබසාධන අර්බුදය තව දුරටත් වර්ධනය වී ඇත. මිලියන 1.5ක් වන සිය පුරවැසියන්ට අවශ්‍ය විදුලි බල ප්‍රමානයෙන් දැනට ගාසාව සතුව ඇත්තේ සියයට 35ක් පමනකැයි හමාස් පාලනය යටතේ ඇති ගාසාවේ බලශක්ති අධිකාරියේ සභාපති කනන් ඔබෙයිඩ් පසුගිය ඉරිදා කියා සිටියේ ය. දැනටමත් බොහෝ ප්‍රදේශවල දිනකට පැය දෙකක් විදුලි බලය කපා හැරීම නිසා පීඩා විඳින ගාසාවේ වැසියෝ දැන් දිනකට පැය 8ක් දක්වා විදුලිබලය නොලැබීමේ ඉරනමට මුහුන දී සිටිති.

ඉන්ධන සීමා කිරීම් නිසා "ජාත්‍යන්තර නීති පැහැදිලිව ම උල්ලංඝනය වී" ඇති බව ප්‍රකාශ කල මානව අයිතිවාසිකම් පිලිබඳ උද්ඝෝෂනය කරන්නන්ගේ විරෝධතා ඊස්රායල ශ්‍රේෂ්ඨාධිකරනය නිෂ්ප්‍රභ කලේ ය. මෙහි මානව හිමිකම් ප්‍රශ්න නැතැයි ශ්‍රේෂ්ඨාධිකරනය ප්‍රකාශ කලේ ය.

## ඊස්රායලයේ ඉල්ලීම්

අනාගත පලස්තීන රාජ්‍යයක් හමුදාකරනයෙන් තොර, සිය අභ්‍යන්තර ආරක්ෂක බලකායන්ගේ ආයුධ සීමා කල, කලාපයක් විය යුතු බවට ඊස්රායලය ඉල්ලා ඇත. එවැනි රාජ්‍යයක ප්‍රධාන කර්තව්‍යය වනුයේ එම ප්‍රදේශයෙහි ඊස්රායලයෙහි සුරක්ෂිත භාවය තහවුරු කිරීම ය. ඇනාපොලිස් සම්මේලනයට පෙරාතුව වොෂින්ටනයෙහි දී ගිවිස ගන්නා ලද පරිදි නිශ්චිත

වැඩ පිළිවෙල් තීරනය වනුයේ එක්සත් ජනපද විශේෂ ආරක්ෂක නියෝජිත ජනරාල් ජේම්ස් ජෝන්ස් සමග සාකච්ඡා තුලිනි.

පලස්තීන ගුවන් ආක්‍රමනය තුල ඊස්රායල ගුවන් ගමන්වලට සීමා නොපැමිනවිය යුතු බව මායිම් හරහා ග-වන් ගමන් අධීක්ෂනය කිරීමේ අයිතිය ද ඊස්රායලය තව දුරටත් ඉල්ලා සිටී.

බටහිර ඉවුරෙහිද ඊජිප්තුවෙන් වෙන්වෙන ගාසාවේ දකුනු දිග මායිමට ආසන්නව රෆාහි පිහිටි ෆිලඩෙල්ෆියා මරේගය දිගට ජාත්‍යන්තර බලකායක් ඵලදායී ලෙස මෙහෙය වීමට ඊස්රායලයට අවශ්‍යව ඇත. ජෝර්දාන නිම්නයෙහි ස්ථිර අයිඩීඑෆ් "පැටලෙන කම්බි" සහිත වලක්වන බලකායක් ද දිගු කාල පරිච්ඡේදයකට යෙදවීමට ද ඊස්රායලයට අවශ්‍යව ඇත. ජෝර්දානය වෙතින් ආක්‍රමනයක සම්භාව්‍යතාවක් ඇතැයි ඊස්රායලය නිගමනය කල අවස්ථාවක පලස්තීනයේ එකලගතාවය ඇතිව බටහිර ඉවුරෙහි මෙය උපයෝගී කර ගනු ඇත.

ජාත්‍යන්තර දකුනු ලෙබනන බලකා තුල සිය සහභාගිත්වයෙන් අනතුරුව කලාපයෙහි සිය තත්වය ආරක්ෂා කර ගැරනීම සඳහා යුරෝපීය බලවත්තු හා විශේෂයෙන් ප්‍රන්සය, පලස්තීනය තුල ජාත්‍යන්තර බලකායකට සම්බන්ධ වීමකට දැඩි කැමැත්ත් දක්වන බවක් පෙනී යයි. ඒ සම්බන්ධයෙන් යුරෝපා සංගමය වර්තමානයෙහි "ඇහුම් කන් දීමේ පිලිවෙතක" සිටින බව එහි මැදපෙරදිග නියෝජිත මාක් ඔටෝ පෙන්නුම් කර ඇත. "ඒ පිළිබඳ සියලු පාර්ශවයන්ට ඕනෑකමක් ඇති බව අප තහවුරු කර ගත යුතුය"යි ඔහු තව දුරටත් කියා සිටියේ ය.

කාල වකවානුව හා කොන්දේසි යෝග්‍යවූවිට පලස්තීන ආරක්ෂක සේවාවන්ට සහාය වීම සඳහා ජාත්‍යන්තර බලකායක් ඵලදායී ලෙස මෙහෙය වීමට ප්‍රන්සය අදහස් කරන බව පැරීසියේ ගුවන් ආධාර සම්මේලනයේ දී ජනාධිපති සාකෝසි සිය ආරක්ෂක දේශනයෙහි පැවසීය. එවැනි බලකායක් යෙදවීමේ ප්‍රතිපත්තිය පලස්තීන අධිකාරිය කලාන් පිලිගෙන තිබූ බව පැහැදිලි කරමින් අබ්බාස් මේ ප්‍රකාශය සාදරයෙන් පිලිගත්තේ ය.

ඊස්රායලයේ කිසියම් ඉඩම් ප්‍රමානයක් පස්තීන පාලනයට භාරදීමට කටයුතු කරන්නේ නම් ආරකෂාව සහතික කිරීමේ ලා උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධනය හෙවත් නේටෝව කාර්යභාරයක් පටු කල යුතු බව පසුගිය මාසයේ දී පැවති නේටෝ රැස්වීමක දී ඊස්රායල විදේශ කටයුතු ලේකම් සීපී ලව්නි කියා සිටියා ය. "පලස්තීන අධිකාරියේ හැකියාවන් ශක්තිමත් කිරීම අපේක්ෂා කරන ක්‍රියාවලියක දැන් අපි යෙදී ඇත්තෙමු. ඒ හේතුවෙන් ඊස්රායලයට එරෙහිව සටන් කරනු වෙනුවට ඔවුන් ත්‍රස්තයට එරෙහිව සටන් වදිනු ඇත. එසේ වුව ද, බිම් මට්ටමෙහි වෙනසකට සැබෑ වෙනසකට ඇති අවශ්‍යතාවට සහාය වීමෙහි ලා නේටෝවෙහි භූමිකාව කුමක් විය යුතු ද යන්න සාකච්ඡා කිරීමෙහි අවශ්‍යතාවයෙහි සම්භාව්‍යතාව කෙනෙකුට බැහැර කල නොහැකි ය"යි ඇය කියා සිටියාය.

හමාස් සංවිධානයට එවැනි අධිරාජ්‍යවාදී කුමන්ත්‍රනවලට එරෙහිව විකල්පයක් නොමැත. යුරෝපීය බලවතුන් එක්සත් ජනපදයට හා ඊස්රායලයට සමබරව ක්‍රියා කරනු ඇතැයි යන අපේක්ෂා ඇතිව ඔවුන් කෙරෙහි විශ්වාසය ඇතිව කටයුතු කිරීමේ සූදානමක් හමාස් සංවිධානය පෙන්නුම් කර ඇත. ඕනෑම ජාත්‍යනතර බලකායක් යෙදවීම පලස්තීන කටයුතුවලට "පැහැදිලි අතපෙවීමක්" ලෙස හමාස් සංවිධානය කලින් ප්‍රතික්ෂේප කර ඇත. එනමුදු පසුගිය ජූනි මස අබ්බාස් විසින් තනතුරින් පහකරන ලද ඡන්දයෙන් තෝරා පත් කරගත් හමාස් අගමැති ඉස්මයිල් හනියේ සාර්කෝසි අමතන ලද දිගු ලිපියකින් පලස්තීනුවන්ට සහාය ලබා දෙන ලෙස උදක්ම බලකර සිටියේ ය. "කලාපයෙහි ආරක්ෂාව හා ස්ථාවරත්වය ස්ථාපිත කිරීම සඳහා ගන්නා සියලු ජාත්‍යන්තර උත්සාහයන් සමග සහයෝගීව කටයුතු කිරීමට ගාසා ආන්ඩුව සූදානම්ව සිටින බව" ද ඔහු කියා සිටියේ ය.

සාර්කෝසිට උනුසුම් ලෙස ප්‍රශංසා කරමින් හනියේ මෙසේ ලිවීය: "මෑතක දී පවත්වන ලද පැරිස් සම්මේලනයේ දී ඔබේ දේශනය අපි කියවීමු. වාඩිලා ගැනීම අවසන් කිරීම, පලස්තීන ජනතාවගේ නීත්‍යානුකූල අයිතීන් ආපසු ලබාදීම හා ඔවුන්ගේ පීඩනය අවසන් කිරීම ඉලක්ක කොට ගත් ධනාත්මක හා දිරිගන්වන සුලු මුල් පියවර ගනනාවක් එහි අපි දුටිමු."

පලස්තීනුවන් පාලනය කිරීමෙහි ලා ඊජිප්තුව වඩාත් සෘජු ලෙස සම්බන්ධ විය යුතු යයි ද ඊස්රායලය ඉල්ලුම් කර ඇත. ඊජිප්තුව ගාසා තීරු මායිමෙහි රැකවල් ලෑ යුතු බවට ද ඊස්රායලය ඉල්ලා තිබේ. එමගින් උමංපද්ධතියක් හරහා හමාස සංවිධානයට හා අනෙකුත් සටන්කාමී විරුද්ධවාදීන්ට ආයුධ ලැබීම වැලැක්වෙනු ඇත.

ආයුධ හෙරෙ රහසේ ගෙන ඒමට එරෙහිව ප්‍රමානවත් දැඩි පියවර නොගැනීම ගැන ලව්නි ඊජිප්තුවට චෝදනා කර ඇත. එක්සත් ජනපදය පසුගිය මාසයේ එක්සත් ජනපද ඩොලර් මිලියන 100 ක ආධාර ඊජිප්තුවට දෙන ලද්දේ සිය කොන්දේසි සපුරා ලීම මත පිහිටා ය. ආයුධ හොර රහසේම ගෙන ඒම වැලැක්වීම සඳහා ඊජිප්තු ගාසා තීරු මායිම ආරක්ෂා කිරීම, ඊජිප්ලු පොලිස් නිලධාරින්ට මානව හිමිකම් පිලිබඳව වැඩිපුර පුහුනුව ලබා දීම හා අධිකරන ස්වාධීනත්වය පිලිබඳව නෛතික සහතික ලබා දීම මෙම කොන්දේසිවලට ඇතුලු විය.

වොෂින්ටනයේ මෙම ඉල්ලීම්වලට අනුකූල තාවය දැක්වීමට ඊජිප්තුව එකගවී ඇත. ආයුධ හොර රහසේ ගෙන ඒම සඳහා යොදා ගන්නා ලද උමං අනාවරනය කරගෙන විනා ශ විනාශ කිරීමට ඊජිප්තුව සිය උත්සාහයන් තර කොට ඇත. උමං පරීක්ෂා කිරීම සඳහා උමං අනාවරනය කරගැනීමට අවශ්‍ය තාක්ෂනික උපකරන වෙනුවෙන් එක්සත් ජනපද හමුදා ආධාරවලින් ඩොලර් මිලියන 23ක් වැය කිරීම සඳහාත් එක්සත් ජනපද හමුදාවේ ඉංජිනේරු බලඇනියට බලය පැවරීම සහ සිය බලකායන්ට පුහුනුව ලබා දීම සඳහා එක්සත් ජනපද හමුදා පිරිස්වලට ඉඩ සැලසීමට ද කයිරෝ ආන්ඩුව එකඟ වී තිබේ.

1978 වසරේ කැම්ප් ඩේවිඩ් සම්මුතිය යටතේ සිය ගාසා මායිම පාලනය කිරීමට මුලුමනින් ම පාහේ නොහැකි යයි ඊජිප්තුව මැසිවිලි නගා ඇත. එම සම්මුතියට අනුව මෙම මායිමෙහි ඊජිප්තුව විසින් යෙදිය හැකි පොලිස් නිලධාරින් ගේ සංඛ්‍යාව 750ක උපරිමයකට යටත් වේ. එම නිසා මේ ප්‍රදේශය ආරම්භ කිරීමට හෙලිකොප්ටර් යානාවල ද සහාය ඇතිව 3000 ක පිරිසක් යෙදවීමට ඉඩ සැලසෙන පරිදි මෙම ගිවිසුම සංශෝධනය කරන ලෙස කයිරෝ ආන්ඩුව ඉල්ලා ඇත.

මහජනතාව අතර ජනප්‍රියත්වයට තුඩු දෙන කරුනක් යටත් පිරිසෙයින් යම්තාක් දුරකට පලස්තීන සටන වෙනුවෙන් අරාබි ධනේශ්වරය වාචික පොරොන්දුවලට සීමාවන අතර එක්සත් ජනපදය සමග සබඳතා හා එරට මත යැපීම ඔවුනට වඩාත් වැදගත් වේ. පලස්තීනුවන් හා ඊස්රායල ඉල්ලීම් අරභයා ඔවුන්ගේ ආකල්ප තීරනය වන්නේ මේ කරුනින් ය.

## ඊස්රායලය සිය ග්‍රහනය තහවුරු කර ගැනීම

මේ කාල වකවානුව පුරා ඊස්රායලය එහි භූමිය අල්ලා ගැනීමේ ක්‍රියා කලාපය තහවුරු කර ගනිමින් සිටී. අනාගත පලස්තීනයකට භාරදෙන භූමි භාගය බටහිර ඉවුරෙහි ඉතා කුඩා, එකිනෙකට යාබද නොවූ ප්‍රාන්තවලට සීමා කිරීමට ඊස්රායලය තීරනය කර ඇත. මේ ප්‍රාන්ත සියල්ල ගාසා තීරුවෙන් වෙන් වන අතර එයට ප්‍රවේශ වීම පිලබඳව පාලනයක් ඇති නොවනු ඇත.

හාර්හෝමාහි වැඩිපුර නිවාස 300ක් ඉදි කරන බවට ඊස්රායල ආන්ඩුව නිවේදනය කොට ඇත. මෙය ජෙරුසලම හා බෙත්ලෙහෙම අතර වාඩිලාගත් භූමියෙහි ඇති ජනාවාසයකි. මේ තුලින් නැගෙනහිර ජෙරුසලම සිය අගනුවර කර ගැනීම පලස්තීනුවන්ගේ අපේක්ෂාවයි. මේ වට ලැම තුලින් බටහිර ජෙරුසලමෙහි වෙසෙන පලස්තීනුවන්ගේ නගරයෙන් පිට ගමන් බිමන් අපහසු වන ඇත.

අබ්බාස් සතුටු කිරීමට බුෂ්ගේ සංචාරයට ප්‍රථමයෙන් බටහිර ඉවුරෙහි ඇති 100කට අධික ඇතින් පිහිටි අනවසර ජනාවාස කඳවුරුවලින් කිහිපයක් කඩා බිඳ දරමීමට ඕල්මර්ට් එකඟ විය. ඊස්රායලවරුන් 460,000කට නිවාස පහසුකම් සැපයෙන බටහිර ඉවුරෙහි හා නැගෙනහිර ජෙරුසලමයෙහි සියලු ජනාවාස ජාත්‍යන්තර නීතිය යටතේ නීති විරෝධී වන අතර ඈතින් පිහිටි මෙම කඳවුර ඊස්රායල ආන්ඩුව මගින් පවා බලය නොපැවරුනු ඒවා යයි කියනු ලැබේ.

ඈතින් පිහිටි කඳවුරු ඒරියල් ෂැරොන්ගේ නිපැයුමකි. හුදෙකලාවූ ජනාවාස අතර භෞමික සමීපස්ථ බව ස්ථාපිත කිරීම සඳහා "කඳු අලුලා ගන්නා ලෙස " අන්ත ජාතිකවාදීන්ගෙන් හා ආගමික පදිංචිකරුවන්ගෙන් ඔහු 1990 ගනන්වල අග භාගයේ ඉල්ලා සිටියේ ය. එමගින් පලස්තීනුවන් යටතට ඉඩම් පත් වීම වැලකුනි. ඈතිනි පිහිටි මෙම කඳවුරු බටහිර ඉවුරේ කඳු මුදුන් මත මාර්ග දුසිම් ගනනකින් සමන්විතවේ. යටත් පිරිසෙයින් ඈතින් පිහිටි මෙම කඳවුරු 75ක් වත් තනන ලද්දේ පලස්තීනුවන්ගේ පෞද්ගලික ඉඩම්වල ය. ඒ සියල්ලෙහිම මිනිසුන් පදිංචි වී නැති නමුදු දැනට 3000ක් පමන ජනයා ඒවායෙහි වෙසෙති.

බුෂ්ගේ මාර්ග සිතියම යටතේ ඊස්රායලය සියලු පදිංචි කිරීමේ ක්‍රියාවලින් නවතනු ඇතැයි ද 2001 මාර්තු මාසයෙන් පසුව ස්ථාපිත කරන ලද ඈතින් පිහිටි කඳවුරු 50ක් පමන ඉවත් කරනු ඇතැයි ද අපේක්ෂා කෙරුනි. කඳවුරු කීපයක් කඩා බිඳ දැමීමෙන් අනතුරුව ෂැරොන් ආන්ඩුව කිසිවක් නොකලේ ය. කඩා බිඳ දමන ලද කඳවුරු කිහිපයෙන් අඩක් පමන ජනයා පදිංචිව නොසිටි ඒවා ය.

2006 වසරේ ඊස්රායල කම්කරු පක්ෂ නායක අමීර් පෙරෙට්ස් ආරක්ෂක ඇමති වූ විට අනිකුත් ජනාවාස නීත්‍යානුකූල කිරීමේ පදනම මත ජනාවාස කිහිපයක් ස්වෙච්ඡාවෙන් ඉවත් කිරීමට ඔහු සාකච්චා මගින් ගිවිස ගත්තේ ය. ඈතින් පිහිටි කඳවුරු 13කට එරෙහිව ඊස්රායල ආරක්ෂක බලකා (අයිඩීඑෆ්) "සීමා සලකුනු කිරීමේ නියෝග" නිකුත්කල ද ඉවත් කරන ලද්දේ 3ක් පමනි. ඉහල උසාවියේ නියෝග පැවතිය ද, අනිකුත් කඳවුරු අත්හැර දමා නැත. ඇතැම් ස්ථානයන්හි ඉවත් කරන ලද කඳවුරු වෙනුවට හමුදා කඳවුරු ආදේශ කෙරෙනු ඇත.

බරුච් ස්පීගල් විසින් 2006 වසරේදී සකස් කරන ලද වාර්තාවක් ප්‍රකාශයට පකත් කිරීමට තහනම් කිරීමට ඊස්රායල ආන්ඩුව උත්සුක වී ඇත. එවකට ඔහු ආරක්ෂක ඇමතිගේ උපදේශකයකු විය. එම වාර්තාවේ සියලු ජනාවාස හා ඈතින් පිහිටි කඳවුරු පිලිබඳව සවිස්තරාත්මකව සඳහන් වේ. ජනාවාස දුසිම් ගනනක පුලුල්ලෙස පැතිරුනු ඉදිකිරීම් කටයුතු බොහෝ

විට බලපත්‍ර නොමැතිව කර ඇති බවට 2006 ඔක්තෝබරයේ දී හාරෙට්ස් පුවත්පත වාර්තා කලේ ය.

නීතිඥයෙකු වන ටලියා සැසන් විසින් ඇතින් පිහිටි කඳවුරු පිලිබඳව සකස් කරන ලද වාර්තාවකට අනුව, ඊනියා අනවසර කඳවුරු බොහොමයකට පහසුකම් සලසන ලද්දේ ආන්ඩුවේ ආයතන පොදු ආයතන හා ජුඩෙයාහි හා සමාරියාහි (බටහිර ඉවුර ඊස්රායලවරුන් හඳුන්වන්නේ මෙලෙස ය) කලාපීය සභා විසිනි. වාර්තාව සකස් කිරීමේ කාර්ය භාරය මෙම නීතිඥයාට පවරන ලද්දේ ෂැරොන් ආන්ඩුව විසිනි.

ස්පීගල් වාර්තාව මත පනවන ලද තහනම උසාවිය ලවා ඉවත් කරවීම ප්‍රයත්න දැරූ සංවිධානයක් වන 'වහාම සාමය' හෙවත් 'පීස් නව්' සංවිධානය, " රාජ්‍ය ආරක්ෂාවට හා විදේශීය සබඳතාවලට හානි ගෙන දෙනු ඇතැයි යන බිය" හුවා දක්වමින් මෙම වාර්තාව නිකුත් නොකලයුතු බවට බුෂ්ගේ ඊස්රායල සංචාරය අත ලඟ තිබිය දී උසාවිය ඉදිරියේ ඊස්රායල ආන්ඩුව තර්ක කල බවට මෙම සංවිධානය ප්‍රකාශ කර සිටී.

මෑතක දී පැරිසියෙහි පවත්වන ලද ආධාර සපයන රටවල සම්මේලනයෙහි දී එක්සත් ජනපදය, යුරෝපා බලවතුන් හා අරාබි පාලන තන්ත්‍ර විසින් එක්සත් ජනපද ඩොලර් බිලියන 7.4ක ආධාර ලබා දීමට ප්‍රතිඥා දෙන්නට යෙදුනි. ඊස්රායලය විසින් මායිම් වසා දැමීම, අවුරාලීම, ඇඳිරිනීති හා මාර්ග බාධක ක්‍රියාත්මක කිරීම හේතු කොට ගෙන පලස්තීන ආර්ථිකය විනාශ වී ඇත. මේ ආධාර සැපයෙන්නේ මෙසේ විනාශ වී ඇති පලස්තීන ආර්ථිකය ගොඩනැගීමට නොව, පලස්තීන අධිකාරියේ ආරක්ෂක බලකායන් නඩත්තු කිරීම වෙනුවෙනි. එනමුදු මීට කලින් එවැනි ප්‍රතිඥා ඉටු කර නැත. මෙයට ප්‍රධාන හේතුව වන්නේ ඊස්රායලය මාර්ග බාධක ඉවත් නොකරන හා මායිම් විවෘත නොකරන තත්වයක් යටතේ පලස්තීනුවන්ට සිය කෘෂිකාර්මික නිෂ්පාදන වෙලඳපොලට ගෙන ඒම ට නොහැකි වීම ය.

ඊස්රායලය ඉක්මනින් ම මෙම සීමා කිරීම් ඉවත් කරනු ඇතැයි අපේක්ෂා කල නොහැක. එසේ ඉවත්කර ගත්තද ලෝක බැංකුව විසින් ද පිලිගෙන ඇති පරිදි එවැනි ආධාර තුලින් ආර්ථිකය ඇකිලී යාම වැලැක්විය නොහැකි ය. තත්වය දැන් කොතරම් අයහපත් ද යත් ජනගහනයෙන් හතරෙන් පංගුවක් සිය පැවැත්ම සඳහා යැපෙනුයේ ජාත්‍යන්තර සහනාධාර සපයන මත හා පිටරටවල සේවය කරන සිය පවුල්වල සාමාජිකයන් එවන මුදල් මත ය.

පලස්තීනයෙහි වැදගත්ම සංවර්ධන ව්‍යාපෘතිය වන එහි ගෑස් වැඩ සටහන අවසන් කරන බවට බ්‍රිටිෂ් ගෑස් සමාගම මේ සතියේ නිවේදනය කලේ ය. පලස්තීන අධිකාරිය මගින් පාලනය කරනු ලබන මධ්‍යධරනියෙහි ගෑස් භූමියක් සකස් කිරීම සඳහා මාස 18කට අධික කාලයක් තුල එම සමාගම සාකච්ඡා පවත්වා ඇත.

එම ප්‍රදේශයේ සංවර්ධනය සඳහාත් පලස්තීන අධිකාරිය හා ඊස්රායලය අතර සහයෝගිතාව සඳහාත් මෙම යෝජනාව ප්‍රමුඛ ව්‍යාපෘතියක් විය. එනමුදු එම ව්‍යාපෘතියෙන් ලැබෙන ආදායම් හමාස් සංවිධානය වෙත ගලා යනු ඇතැයි ඊස්රායලය බිය පලකල නිසා සාකච්ඡා බිඳ වැටුනි. ජෙරුසලමයෙන් අල්ප වසයෙන් හෝ ස්වාධීනත්වයක් ස්ථාපිත කිරීම සඳහා පදනමක් මේ ව්‍යාජ හේතු දැක්වීම නිසා නැවත වරක් පලස්තීන ධනේශ්වරයට අහිමි කොට ඇත.

© www.wsws.org